# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2239/38 - 2021 අගෝස්තු මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2021.08.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ වගන්තියේ (4) වැනි උපවගන්තිය යටතේ වූ නියමය**

1975 අංක 39, 1981 අංක 14, 1981 අංක 39, 1986 අංක 14 සහ 1986 අංක 48 දරන පනත්වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 01 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (4) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම,

(අ) එකී සංශෝධිත ඉඩම් ප්‍රතිසංස්කරණ නීතියේ ප්‍රතිපාදනවලට අනුකූලව 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ජනතා වතු සංවර්ධන මණ්ඩලයට පවරා දී ඇත්තා වූ ද, මෙම නියමයේ පළමුවන උපලේඛනයේ සවිස්තර ලෙස දක්වා ඇත්තා වූ ද, ඉඹුල්ගස්වාඩිය වත්ත යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන වතු ඉඩම හා සම්බන්ධ 1987 අගෝස්තු මස 28 වැනි දින අංක 468/21 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 27 අ (1) වැනි වගන්තිය යටතේ කරන ලද නියමයෙහි මෙහි දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඹුල්ගස්වාඩිය නමැති ඉඩමේ බිම් ප්‍රමාණයට අදාළ වන්නා වූ කොටස ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරනු ලැබීම සඳහා වූ ප්‍රතිෂ්ඨාවට අදාළ නියමයන් හෝ කොන්දේසි අනුව ක්‍රියාකර නොමැති වීමේ පදනම මත, ප්‍රත්‍යාදිෂ්ය කිරීම මගින් එම නියමය මෙයින් සංශෝධනය කරමි, සහ

1A - G 34779 — 23 (2021/08)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

(ආ) මෙම ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම මත මෙම නියමයේ දෙවැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ඉඩම් ප්‍රමාණය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

**පළමුවන උපලේඛනය**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරා ඇති ඉඹුල්ගස්වාඩිය වත්ත නම් වූ ඉඩමේ විස්තර

| *අති විශෙෂ ගැසට් පත්‍රයේ අංකය සහ දිනය* | *වතු ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ජනතා වතු සංවර්ධන මණ්ඩලය වෙත පවරන ලද ඉඩම් ප්‍රමාණය හෙක්.* |
|---|---|---|---|---|
| අංක 468/21 1987.08.28 | ඉඹුල්ගස්වාඩිය වත්ත | ගම්පහ | කටාන | 28.52 |

**දෙවන උපලේඛනය**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත නැවත පැවරෙන ඉඩම් කොටසෙහි විස්තර

| *විශේෂ අංකය* | *වතු ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය (ගම)* | *කොමිෂන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| කො/1717 | ඉඹුල්ගස්වාඩිය වත්ත | ගම්පහ | කටාන | කදිරාන උතුර | බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ කදිරාන උතුර ගමේ පිහිටි බලයලත් මානක බී. කේ. එස්. බමුණුසිංහ මහතා විසින් මැන සකසා ඇති අංක 6477 හා 2021.02.07 දිනැති පිඹුරේ කැබලි අංක A ට මායිම්- උතුරට ඃ එම ඉඩමේ කැ. අ. 1 හා කැ. අ. 3 හි කොටසක් ද, නැගෙනහිරට ඃ එම ඉඩමේ කැ. අ. 3 හි කොටසක් ද, දකුණට ඃ එම ඉඩමේ කැබලි අංක 1 සහ කැ අ. B ද, බටහිරට ඃ එම ඉඩමෙ කැ. අ. 1 සහ කැ. අ. 3හි කොටසක් ද,<br>කැබලි අංක B ට මායිම්- උතුරට ඃ එම ඉඩමේ කැ. අ. 1 සහ කැ. අ. A ද, නැගෙනහිරට ඃ එම ඉඩමේ කැ. අ. 3හි කොටසක් ද, දකුණට ඃ (මා.සං.අ.) මාර්ගය ද, බටහිරට ඃ එම ඉඩමේ කැ. අ. 1 සහ කැ. අ. C හා D ද,<br>කැබලි අංක C ට මායිම්- උතුරට ඃ කැ. අ. D ද, නැගෙනහිරට ඃ කැ. අ. B ද, දකුණට ඃ (මා.සං.අ.) මාර්ගය ද, බටහිරට ඃ රජයේ ඉඩම් ද,<br>කැබලි අංක D ට මායිම්- උතුරට ඃ එම ඉඩමේ කැ. අ. 1 ද, නැගෙනහිරට ඃ එම ඉඩමේ කැ. අ. 1 හා කැ. අ. B ද, දකුණට ඃ කැ. අ. C හා රජයේ ඉඩම් ද, බටහිරට රජයේ ඉඩම් හා කැ. අ. E ද, |

| *විශේෂ අංකය* | *වතු ඉඩමේ නම* | *පරිපාලන දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ග්‍රාම නිලධාරි කොට්ඨාසය (ගම)* | *කොමිෂන් සභාවට පැවරෙන ඉඩම් ප්‍රමාණය* |
|---|---|---|---|---|---|
| | | | | | කැබලි අංක E ට මායිම්- උතුරට : එම ඉඩමෙහි කැ. අ. 1 ද, නැගෙනහිරට : රජයේ ඉඩම් හා කැ. අ. D ද, දකුණට : රජයේ ඉඩම් හා කැ. අ. F ද, බටහිරට : කැ. අ. F ද, කැබලි අංක F ට මායිම්- උතුරට : එම ඉඩමේ කැ. අ. 1 හා කැ. අ. E ද, නැගෙනහිරට : එම ඉඩමේ කැ. අ. 01, කැ. අ. E සහ රජයේ ඉඩම ද, දකුණට : රජයේ ඉඩම් ද, (මා. සං. අ.) මාර්ගය සහ කැ. අ. H ද, බටහිරට : කැ. අ. H සහ G ද, කැබලි අංක G ට මායිම්- උතුරට : එම ඉඩමේ කැ. අ. 01 ද, නැගෙනහිරට : කැ අ. F ද, දකුණට : කැ. අ. H ද, බටහිරට : රජයේ ඉඩම් ද, කැබලි අංක H ට මායිම්, උතුරට : කැ. අ. G හා F ද, නැගෙනහිරට : කැ. අ. F ද, දකුණට : (මා.සං.අ.) මාර්ගය සහ රජයේ ඉඩම් ද , බටහිරට : රජයේ ඉඩම් ද, යන මායිම් තුළ පිහිටි ඉඹුල්ගස්වාඩිය වත්ත නමැති ඉඩමේ අක්. 25, රූඩ් 0, පර්. 00 (හෙ. 10.1170)ක් වන බිම් ප්‍රමාණය වේ. |

08 - 247

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.